

## කස්තිරම
### ඩී බී කුරුප්පු

# පෙරවදන - පසුවදන හා චූර්ණිකාව

පොදු රාජ්‍ය මණ්ඩලීය ක්‍රීඩා නරඹන්නට - වාර්තා කරන්නට පැමිණි පුවත්පත් කලාවේදීන් අතුරින් කෙනකු වූ 'දිනමිණේ' සම්පත් බණ්ඩාර පොත් පළ කිරීම ගැන වැදගත් අදහසක් මට කියා දුන්නේය. එය අදහසකට වඩා උපදෙසක් වශයෙන් දෙන ලද්දකි. පොත සිංහලෙන් ලියැවුණද පිටුපස කවරයේ චූර්ණිකාව ඉංගිරිසියෙන් ලිවීම නොහොත් ලියවා ගැනීමය, ඒ අදහස.
එය පිළිපදිම් දැයි තවමත් හිතා ගන්නට මා අපොහොසත් වුවද පොතක අන්තර්ගතයට අමතරව ලියන කොටස් ගැන මාගේ අවධානයට යොමු කරන්නට සම්පත්ගේ උපදේශය සමත් විය.
චූර්ණිකාව මගේ වචනයකි. මලලසේකර ශබ්ද කෝෂයේ එයට කියන ඉංගිරිසි පදය තේරුම කර ඇත්තේ 'පොතක් පිළිබඳ කවරයේ ඇති වර්ණනාව' යනුවෙනි. කොයි ආකාරයකින් හෝ පොතක් අතට ගත් විට කියවන්නට කලින් එහි පෙරවදන - පසුවදන හා චූර්ණිකාව ද කියවීමට මම පුරුදුව ඇත්තෙමි. එයින් එක්තරා විනෝදයක් ද ලබමි.මෙය ලියන්නේ ඒ විනෝදය පාඨකයා සමග බෙදා හදා ගැනීම සඳහාය.


> මේ කියන නම් විසි හතරට අමතරව පුවත්පත් හා මාධ්‍ය ආයතන ද ස්තුති පූර්වකව සඳහන් කර ඇත.
> ''මගේ පොත ගැන ''සිළුමිණේ'' පිටු භාගයක විස්තරයක් පළ වුණා'' යයි පොතේ කතුවරයා මා සමග පැවසූ විට ඒ ගැන මා පුදුම නොවූයේ මෙම පසුබිම දත් හෙයිනි.


පෙරවදන යන්නෙන් මා අදහස් කරන්නේ පොතේ මුලට එන විස්තරයයි. ලිවීමට යොමුවීම ගැන, උදව් උපදෙස් දුන් අය ගැන, පිටපත හා තේමාව, පත්‍ර කියවූවන් ගැන, ප්‍රකාශකයා, මුද්‍රණකරු ගැන පමණක් නොව බොහෝ විට ලේඛකයාට නොහොත් ලේඛිකාවට අවශ්‍ය මානසික සහනය , ධෛර්යය, දුන් භාර්යාව නොහොත් ස්වාමි පුරුෂයා ගැන ද කියවන්නට ලැබෙයි. දරුමල්ලන්ද ඒ අයට සඳහන් වුවහොත් එය ද පුදුමයට කරුණක් නොවේ. මට එහෙම ලියන්නට ඉඩක් නැතිකමට ඇති වන නරුම හැඟීමක් නිසා මෙය කියනවා යයි සිතුවොත් මම පුදුමද නොවෙමි.

පෙරවදන තරමක අළුත් වචනයකි. ඉස්සර ලියුවේ සංඥාණය නොහොත් පූර්විකාව යනුවෙනි. ප්‍රස්තාවනාව තවත් වචනයකි.

ගෞරවනීය තියඩෝර් ජී. පෙරේරා උන්නාන්සේ විසින් සංගෘහිත 'සිංහල භාෂාව' නමින් වූ ව්‍යාකරණ පොතේ පිටපතක් මා ලඟ තිබේ. අප සිංහල පාසැලේදී භාවිතා කළ මේ පොත ලියා ඇත්තේ 1932 දීය. ඒ යුගයේ චාරිත්‍රයට අනුව සංඥාපනය ඉංගිරිසියෙන් හා සිංහලෙන් ද ලියා ඇත. 1952 ලියන ලද සෝරත හාමුදුරුවන්ගේ ''ශ්‍රී සුමංගල ශබ්ද කෝෂය' ද මෙම සිරිත අනුගමනය කර ඇත. සිංහල, ඉංගිරිසි සංඥාපන දෙකේ අගට සැලකිය යුතු වෙනසක් ඇත. සිංහල සංඥාපනය ලියා ඇත්තේ ශ්‍රී බුද්ධ වර්ෂ 2496 ක් වූ ඇසළ මස පුර පසළොස්වක ලක් ගුරු දින ය. ඉංගිරිසි සංඥාපනය 1952 ජූලි 3 වැනි දිනය.

ගිය අවුරුද්දේ ප්‍රකාශයට පත් ගුණසේන මහා සිංහල ශබ්ද කෝෂය ආචාර්ය හරිශ්චන්ද්‍ර විජේතුංග ගේ කෘතියකි. එහි එන්නේ සිංහල පෙරවදනක් පමණි. මලලසේකර ශබ්දකෝෂය ඉංගිරිසි - සිංහල දෙක යා කරන්නක් හෙයින් ඒ දෙබසින්ම සංඥාණය තිබීම වැදගත් ය.

පෙර වදන ලිවීමෙහි ලා අන්ත දෙකක් මා දැක ඇත. කියවා ඇත. එක් අන්තයක පෙර වදන වෙනුවට ලියූ වැකි දෙකක් විය. කතුවරයා පුවත්පත් කලාවේදියකු හා නීතිඥයකු වූ ආර්. පල්ලෙවල ය. ඔහුගේ ලිපි හාස්‍යයෙන් , ඊටත් වඩා උපහාසයෙන් පිරී පැවැතියේය. රචනා වශයෙන් දැක්විය හැකි ලිපි සහිත පොත් දෙකක් ඔහු විසින් ලියන ලදි. ''නොගිය මඟ'' හා ''නොදරුවන්'' යනුවෙනි. මා කියන වැකි දෙක ''නොදරුවන්'' නමැති පොතේ තිබුණු බවය, මට මතක ඇත්තේ. ඒ මෙසේ ය. 'මෙයට පෙර වදනක් නැත. තරුණ වයසට හැරමිටි අනවශ්‍ය ය.''

පත්තර කලාවට හා නීතියට බහින්නට කලින් ආනන්ද විද්‍යාලයේ සිංහල ඉගැන්වූ පල්ලෙවල මතක් වන හැමවිටකම මේ වැකි දෙක මා ඉදිරියේ මැවී පෙනෙන්නේය.

අනෙක් අන්තයේ පෙරවදන සහිත පොතේ පිටපතක් මා ළඟ තිබේ. තෑගි ලැබුණු පොතක් නිසා කතුවරයා නමින් සඳහන් නොකරමි. පෙරවදනට වෙනත් මාතෘකාවක් යොදා ඇත. පෙර වදන අතට එන නාම ලේඛනය විචිත්‍රය. භාර්යාව සහ පුත්‍රයා හැරුණු විට තවත් නම් විසි හතරක් ඇත. ඔවුනතුරෙන් හය දෙනෙක් මහාචාර්යවරුය. සමහරෙක් ලේඛකයෝ ය. නම් සඳහන් හැම කෙනෙක් ම වාගේ ප්‍රකට පුද්ගලයෝය. කිහිප දෙනෙකු ගැන කෙටි වර්ණනාවක් ද එයි. තවත් කෙනෙක් විවේචන සැපයූවෝ ය. නැතහොත් පොත් එළිදැක්වීමකට පැමිණි - නොපැමිණි අය ය.
මේ කියන නම් විසි හතරට අමතරව පුවත්පත් හා මාධ්‍ය ආයතන ද ස්තුති පූර්වකව සඳහන් කර ඇත. ''මගේ පොත ගැන ''සිළුමිණේ'' පිටු භාගයක විස්තරයක් පළ වුණා'' යයි පොතේ කතුවරයා මා සමග පැවසූ විට ඒ ගැන මා පුදුම නොවූයේ මෙම පසුබිම දත් හෙයිනි.
පසු වදන හැම පොතකම නැත. අවශ්‍ය වන්නේ ද නැත. එබන්දක් ලිවිය යුත්තේ පොත ලියා හමාර කළ පසු ඇති වූ වෙනසක් පාඨක අවධානයට යොමු කළ යුතු කල්හිය. ඉරාක ආක්‍රමණය ගැන ලියැවුණු පොතක, දෙකක පසු වදන් කියවූවා මට මතකය. පොත මුද්‍රණයට දීමෙන් පසු එක්කෝ ජනාධිපති ජෝර්ජ් බුෂ් යුද්ධය හමාර යයි ඓතිහාසික ප්‍රකාශය කිරීම නොහොත් ඉරාකයේ ඡන්ද විමසීම බඳු දෙයක් සිදුවූ බව කියන්නට ය පසු වදන් ඇතුළත් කර තිබුණේ.
චූර්ණිකාව නොහොත් පසු පිටේ එන වර්ණනාව අර දෙකටම වඩා ලස්සන ය. ලස්සන තවත් වැඩි වන්නේ එය ලියවා ගන්නට හොඳ කෙනෙකු අල්ලා ගත් විට ය. මගේ පොත් තුනක මෙසේ විවිධ පුද්ගලයන් ලියූ චූර්ණිකා ඇත. මා බෙහෙවින් අගය කරන්නේ මගේ ''පීතුපාදං'' කෙටි කතා සංග්‍රහයට මගේ මිත්‍ර පණ්ඩිත අශෝක කරුණාරත්න ලියූ චූර්ණිකාව ය. මා බාර දී ආ පිටපත මුද්‍රණය බාරව සිටියේ ඔහුය. ඔහු මගේ බස් වහර ගැන ප්‍රශංසා මුඛයෙන් සඳහන් කළේය. චූර්ණිකාවේ අග කොටස පමණක් උපුටා දක්වමි.
''අන්දිරියා කොණ්ඩෙ කැපුවත් අන්දිරියාමයි'' යන කියමන සිහි ගන්වමින් ඕස්ට්‍රේලියාවේ පදිංචියට ගියත් ඩී.බී. කුරුප්පුගේ ඉස්කුරුප්පු බුරුල් වී නැති වග ඔහු ලියූ ''පීතුපාදං'' පොතෙන් තහවුරු වෙයි.''
දෙවැනි චූර්ණිකාව මගේ ''නරාවළ සහ සහිල'' කෙටිකතා සංග්‍රහයට වරුණ සාවින්ද ලියූවකි. වරුණ මා මුරුංගා අත්තේ තැබූ නිසා ඉති ටිකක් පාහින්නට මට සිදුවිය.

මගේ ''අර්ධනාරී'' පරිවර්තනයට චූර්ණිකාව ලියන්නට සුදුසු දෙදෙනෙකු ගැන සිතා ගෙන ය මා මුද්‍රණාලයට ගියේ. එහි කාරියකරවන වූ තරුණයා ඒ දෙකින් එක නමක් අනුමත කළේ ''දැන් ඔහු තමා නියම පුද්ගලයා'' යැයි කියමිනි. මගේ සරසවි සගයකු වූ ජේ.ආර්.පී. සූරියප්පෙරුමට කොන්ත්‍රාත්තුව බාර දුන්නේ ඉන් පසුවය.

බොහෝ විට චූර්ණිකාව තනිකර වෙළෙඳ දැන්වීමක් බවට පත්වෙයි. එය ලියන පුද්ගලයාගේ කර පිටින් ලේඛකයා, පාඨකයා අතරට යාමට දරණ බොළඳ ප්‍රයත්නයක් වන්නේ එබඳු තැනදීය. එම චූර්ණිකා ලියන සමහරෙක් පොත නොකියවාම ලියති. එක්කෝ හිතවත්කමට නැතහොත් කාගේ හෝ ඉල්ලීම නිසා ප්‍රතික්ෂේප කරන්නට බැරි කමටය. පොත කියවා හමාර කොට දිරවාගත් පසු එබඳු චූර්ණිකාවක් නැවත වරක් කියවීම හොඳ විනෝදාංශයක් ද වන්නේය.

ඩී.බී. කුරුප්පු

# අන්තර්ජාලයේ සන්නස
## පාඨකයන් ලක්ෂය ඉක්මවයි
www.sannasa.net



**ජනවාරි 7** වන දින සන්නස අන්තර්ජාල වෙබ් අඩවියට සුවිශේෂ වැදගත් දවසක් විය. සන්නස අන්තර්ජාලයෙන් කියවන්නට ගොඩ වැදුණු එක් ලක්ෂ වෙනි පාඨකයා වාර්තා වූයේ එදින යි. මේ සංඛ්‍යාව ''හිට්'' ගණන නොව සැබෑ ගොඩවැදීම් සංඛ්‍යාව බව සළකන්න.

සන්නස මේ වන විට අන්තර්ජාලයේ ජනප්‍රිය පුවත්පතක් බවට පත්ව ඇති බව සංඛ්‍යා ලේඛණ පෙන්වා දෙයි. සන්නස දිනපතා අන්තර්ජාලයෙන් කියවන පාඨක පිරිස ක්‍රමයෙන් වැඩි වෙමින් තිබෙන අතර මේ වන විට ලොවේ විවිධ රටවල සිට අවම වශයෙන් දිනකට පාඨකයන් 500 ක් පමණ සන්නස අඩවියට ගොඩවැදෙයි. මේ වසරේ ජනවාරි 1 දා සිට 12 දක්වා සන්නස ගොඩ වැදුන විදෙස් පාඨක පිරිසේ ප්‍රතිශතය හා මුල් රටවල් දහය පහත දැක්වෙයි.



### TOP TEN COUNTRIES IN JANUARY

| # | Visits | Country |
|---|---|---|
| 1 | 23.96% | Unresolved/Unknown |
| 2 | 19.15% | US Commercial |
| 3 | 17.49% | Network |
| 4 | 12.20% | Australia |
| 5 | 4.07% | United Arab Emirates |
| 6 | 3.59% | Canada |
| 7 | 3.05% | Japan |
| 8 | 2.79% | United Kingdom |
| 9 | 1.81% | Italy |
| 10 | 1.67% | Switzerland |
| 11 | 1.54% | France |
| 12 | 1.08% | Austria |
| 13 | 0.87% | Sri Lanka |
| 14 | 0.80% | Sweden |
| 15 | 0.75% | New Zealand (Aotearoa) |
| 16 | 0.75% | Singapore |
| 17 | 0.64% | Netherlands |
| 18 | 0.59% | US Educational |
| 19 | 0.44% | Germany |
| 20 | 0.41% | Saudi Arabia |
| 21 | 0.40% | Denmark |
| 22 | 0.31% | India |
| 23 | 0.29% | US Government |
| 24 | 0.23% | Norway |
| 25 | 0.14% | Thailand |
| 26 | 0.12% | Bermuda |
| 27 | 0.11% | Belgium |
| 28 | 0.09% | Greece |
| 29 | 0.09% | Russian Federation |
| 30 | 0.08% | United States |

### වෙබ් අඩවියක හිට් ගණන (Hits) යනු කුමක් ද?

වෙබ් අඩවියක හිට් ගණන යනු කිසිදු වැදගත් කමක් නැති සංඛ්‍යා ලේඛණයකි. හිට් ගණන යනු සැබෑ ලෙස එම අඩවියට ගොඩ වැදුණ සංඛ්‍යාව නොවේ. සැබෑ ගොඩවැදීම් (විසිට්) සංඛ්‍යාව 100 ක් වන විට හිට් සංඛ්‍යාව 1500 ක් වන්නට හොඳටම ඉඩ ඇත.

එසේ නම් වෙබ් අඩවියක හිට් ගණන යනු කුමක් ද?

A hit, is the downloading/accessing of a site object e.g. HTML Page, Image, External CSS file etc. So a page with 8 images, and an external CSS file, would generate 10 hits when accessed.

හිට් එකක් යනු වෙබ් අඩවියක එක අංගයක් (උදාහරණයක් ලෙස අඩවියේ ඇති ඇති පින්තූරයක්, HTML ගොමුවක්, හෝ බාහිර CSS ගොමුවක්) ඔබේ පරිගණකයට බාගත (Download) වීමක් වෙයි. එනම් වෙබ් පිටුවක පින්තූර දහයක් තිබුණේ නම් ඒ පිටුව ඔබේ පරිගණකයට එන විට හිට් ගණන දහයක් හෝ එකොළහක් වනු ඇත. වෙබ් අඩවියක පින්තූර විශාල ගණනක් තිබෙන විට හිට් ගණන අති විශාල ලෙස ඉහළ යාම අපට නිරීක්ෂණය කළ හැකි ය.

Hits are worthless to count, what you want to follow is your total number of Unique hits/ Visits.